# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2293/26 – 2022 අගෝස්තු 17 වැනි බදාදා – 2022.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/N/2014/182.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.10.19 දිනැති හා අංක 2198/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2020.10.13 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පස්යාල, කලල්පිටිය, ලක්මල් පෙදෙස, නො. 44 හි පදිංචි ආර්. එම්. පී. නිහාල් රාජපක්ෂ මයා සහ කොළඹ 05, කිරුළ පාර, නො. 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.06.15 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ජූලි මස 25 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය: IR/COM/02/N/2014/182.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය**

නඩු අංකය: A/56/2020

ආර්. එම්. පී. නිහාල් රාජපක්ෂ,
අංක 44,
ලක්මල් පෙදෙස,
කළල්පිටිය,
පස්යාල.

පළමු පාර්ශවය

එදිරිව

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ 05.

*දෙවැනි පාර්ශවය*

**අතර පවත්නා ආරවුල සඳහා ප්‍රදානය**

1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල පනතේ 4 (1) වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2020 ඔක්තෝබර් මස 13 වැනි දින අංක IR/COM/02/N/2014/182 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට එකී ආරවුල මාවෙත යොමුකර ඇත.

*ආරවුලට හේතු වී ඇති කාරණය*

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ෆෝමන්වරයෙකු ලෙස සේවය කළ ආර්. එම්. පී. නිහාල් රාජපක්ෂ මහතාට එදිරිව 2013 වර්ෂයේ අත්තනගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවති අංක 74664/පී.සී. දරන නඩුවෙන් ඔහු නිදොස් කොට නිදහස් කොට තිබුණ ද ඊට පෙර එම කරුණ මතම 2005.06.10 දින වැඩ තහනම් කර විනය පරීක්ෂණයකින් අනතුරු සේවය අවසන් කර තිබීම මගින් ඔහුට අසාධාරණයක් සිදුව තිබේ ද එසේනම් ඔහුට හිමිවිය යුතු සහනයක් කවරේ ද යන්නත් පිළිබඳව වේ'' යනුවෙන් සඳහන් කර ඇත.

පළමු පාර්ශවය වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ප්‍රකාශය අනුව ඔහු 1985.11.20 දින දෙවන පෙළ මෝටර් කාර්මිකයෙක් වශයෙන් පත්වීම් ලබා පළමු තැනට උසස්වීම් ලැබ VII 7 A ශ්‍රේණියට උසස් වීමෙන් අනතුරුව වැඩ මූලික වශයෙන් සේවය කරමින් සිටියදී 2004.04.02 දින මහ මැතිවරණයෙන් පසුව පත් වූ රජයේ දේශපාලන සබඳතා සහිත නිලධාරීන් විසින් දේශපාලනික වශයෙන් හිරිහැර තාඩන පීඩන කර මාස 03 ක පමණ කාලයක් රැකියාව අහිමිව සිටිය දී අසනීප වීම මත රැකියාවට යාමට ද නොහැකිව සිටි බව ප්‍රකාශ කර ඇත.

එසේම සොරකමක් පිළිබඳව සාවද්‍ය චෝදනාවක් ගොනු කර වැඩ තහනමකට තමාව ලක් කළ බව ද ඊට අදාළව ඉහත කී නඩුව අත්තනගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ අංක. 74664/පී.සී. අංකය යටතේ ගොනු කර තිබිය දී අභ්‍යන්තර විනය පරීක්ෂණයක් පවත්වා ඒ අනුව තමාව සේවයෙන් පහ කළ බව ද පළමු පක්ෂය ප්‍රකාශ කර ඇති අතර, දෙවන පක්ෂය විසින් 2005.06.12 දින සේවයෙන් පහ කරන ලද බව දක්වා ඇත.

එසේ තිබිය දී මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවැති නඩුවෙන් පළමු පාර්ශවකරු නිදොස් කොට නිදහස් කරන ලද බව ද ඒ අනුව දෙවන පාර්ශවය විසින් තමාට අසාධාරණයක් සිදු කර ඇති බව ද ප්‍රකාශ කර ඇත. දෙවන පාර්ශවය ගොනු කරන ලද පළමු ප්‍රකාශයෙන්ම ප්‍රබල මූලික විරෝධතා තුන (03) ක් ගොනු කරන ලද අතර, ඒ අනුව

1. වසර 13 කට අධික කාලයක් (2005.06.12 දින සේවය අවසන් කර ඇත) කල් ප්‍රමාද වී මෙම ඉල්ලුම් පත්‍රය ගොනු කර ඇති හෙයින් කාලාවිරෝධී වී ඇති බව ද,

2. බේරුම්කරණයට සේවා සමාප්තිය පිළිබඳ නඩු විසඳීමට අධිකරණ බලයක් නැති බවට ද,

3. සජීවී නඩු නිමිත්තක් පළමු පාර්ශවයට උපචය වී නොමැති බවට ද

මූලික විරෝධතා ගොනු කර තිබිණි.

කොවිඩ් වසංගතය හේතුවෙන් රට වසා තිබිය දී නඩු කැඳවීමක් නොමැතිව පැවති කාල පරාසය තුළ දී 2021.04.19 වන දින පළමු පාර්ශ්වය මිය ගොස් ඇති අතර, ඒ බව කොවිඩ් වසංගතයෙන් පසුව මුල් වරට මෙම නඩුව කැඳවන ලද 2022.02.08 වන දින නඩුව කැඳවූ අවස්ථාවේ දී බේරුම්කරණය වෙත පැමිණ සිටි පළමු පාර්ශ්වකරුගේ බිරිඳ වන නන්දනී සිරිවර්ධන මහත්මිය ද ඔහුගේ බාල පුතණුවන් වන චානක සහන් රාජපක්ෂ ද යන අය විසින් තහවුරු කරන ලදී. කෙසේ වෙතත් පළමු පාර්ශවයේ මුල් ප්‍රකාශය 2021.02.05 දින වනවිටත් දෙවන පක්ෂය වෙත ලැබී නොමැති බව දන්වා සිටි අතර එබැවින් ඔවුන්ගේ දෙවන ප්‍රකාශය මෙතෙක් ගොනු කිරීමට නොහැකි වූ බව ප්‍රකාශ කරන ලද අතර විවෘත අධිකරණයේදීම පිටපතක් ලබා දී 2021.02.19 වන දින කාර්යාලයට ප්‍රකාශ ගොනු කරන ලෙස දන්වා 2021.03.02 දිනට නඩුව කැඳවීමට නියම කරන ලදී.

මෙම අවස්ථාව වන විට පළමු පාර්ශවයේ කිසිදු මූලික සාක්ෂියක් ලබාගෙන නොතිබූ නිසා දෙවන පාර්ශවය එම තත්ත්වයන් යටතේ කිසිදු සමථයකට එකඟ කරගත නොහැකි වූ නිසාත් පළමු පාර්ශ්වකරුගේ බිරිඳ සහ අගතියට පත් ඉහත කී බාල දරුවා වෙනුවෙන් සානුකම්පිත දීමනාවක් ලබා දී මෙම නඩුව අවසානයක් කළ හැකි ද යන ප්‍රශ්ණය සලකා බලන ලෙස දෙවන පාර්ශවයට දැනුම් දුන් අතර ඒ පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලයෙන් විමසා බලා තීරණයක් ගත යුතු ඇති බව ඔවුන් විසින් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව ඒ සඳහා තවත් දිනයක් ලෙස 2022.03.11 දින එය ලබා දෙන ලදී. එදින දෙවන පක්ෂය පැමිණ නොසිටි අතර නියෝජිත තැන පමණක් පෙනී සිටිය දී දෙවන පාර්ශවය වෙනුවෙන් පැමිණි නීති නිලධාරිනී නදීශා අමරතුංග මහත්මිය ප්‍රකාශ කර සිටියේ දැනටමත් පළමු පක්ෂයේ පවුලේ දෙදෙනෙකුටම ලංගම ආයතනයේ රැකියාව ලබා දී ඇති බැවින් තව දුරටත් සානුකම්පිත සහන සැලසීමක් අවශ්‍ය නොවන බවට අධ්‍යක්ෂක මණ්ඩලය ප්‍රකාශ කළ බවයි. පළමු පක්ෂයේ නියෝජිත තැන විසින් ද ඉහත කී කරුණු පිළිගන්නා ලදී. මූලික සාක්ෂි ලබා දීමක් හෝ හරස් ප්‍රශ්න ඇසීමට හැකියාවක් නැති හෙයින් ද උරුමකරුවන් ආදේශ කර නඩුව පවත්වාගෙන යාමේ හැකියාවක් නෛතික වශයෙන් නොපවතින හෙයින් ද දෙවන පක්ෂයේ බලවත් විරෝධතා ද සලකා බැලීමෙන් පසුව පළවන පාර්ශවයේ ඉල්ලීම කිසිදු මූල්‍ය ප්‍රදානයකින් තොරව නිෂ්ප්‍රභා කරනවා හැර වෙනත් නියෝගයක් ලබා දීමේ කිසිදු නෛතික හැකියාවක් මෙම බේරුම්කරණයට නොතිබූ හෙයින් නඩුව නිෂ්ප්‍රභා කරන ලද බව පළමු පක්ෂයේ නියෝජිත තැනට සහ දෙවන පක්ෂයේ නීති නිලධාරිණියට පැහැදිලි කර දී නඩුව අවසන් කරන්නට යෙදුණි.

පළමු පක්ෂය වෙනුවෙන් ගත හැකි සියලුම ක්‍රියා මාර්ග ගැනීමෙන් පසුව උද්ගත වී ඇති නෛතික පදනම පදනම් කොටගෙන දෙන ලද මෙම ප්‍රදානය නීත්‍යානුකූල, සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව වැඩි දුරටත් ප්‍රකාශ කරමි.

විතාරණගේ ජයරත්න,
බේරුම්කරු.

2022 ජුනි මස 15 වැනි දින.
කාර්මික අධිකරණයේ දී ය.

EOG 08 - 0140

මගේ අංකය: IR/COM/01/2019/221.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.04.23 දිනැති හා අංක 2224/32 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.04.01 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් රත්ගම, රිල්ලඹ, සමගි මාවත, අංක 11 හි පදිංචි ඒ. ඩී. සුමනසිරි මයා සහ කොළඹ 03, ගාලු පාර, 445/ඒ, ඒ. ටී. කුරේ ගොඩනැගිල්ල, 3 වන මහල හි පිහිටි චයිනා නැෂනල් ටෙක්නිකල් ඉම්පෝර්ට් ඇන්ඩ් එක්ස්පෝර්ට් කෝපරේෂන්, කොළඹ 03, ගාලු පාර, 445/ඒ, ඒ. ටී. කුරේ ගොඩනැගිල්ල හි පිහිටි රිසෝසස් ඩිවලොප්මන්ට් කන්සල්ටන්ට්ස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.06.09 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ජූලි මස 25 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කාර්මික අධිකරණය - කොළඹ**

ඒ. ඩී. සුමනසිරි මයා,
අංක 11, සමගි මාවත,
රිල්ලඹ, රත්ගම

ආරාවුල් අංකය: IR/COM/01/2019/221

බේරුම්කරණ අංකය: A /40/2021

*පැමිණිලිකරු*

*එදිරිව*

1. චයිනා නැෂනල් ටෙක්නිකල් ඉම්පෝර්ට් ඇන්ඩ් එක්ස්පෝර්ට් කෝපරේෂන්,
3 වන මහල,
ඒ. ටී. කුරේ ගොඩනැගිල්ල,
අංක 445/ඒ, ගාලු පාර,
කොළඹ 03.

2. රිසෝසස් ඩිවලොප්මන්ට් කන්සල්ටන්ට්ස් ලිමිටඩ්,
3 වන මහල,
ඒ. ටී. කුරේ ගොඩනැගිල්ල,
අංක 445/ඒ, ගාලු පාර,
කොළඹ 03.

*වගඋත්තරකරුවන්*

2022 ජුනි මස 09 වැනි දින දී ය.

**බේරුම්කරණ තීන්දු ප්‍රකාශය**

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

*ඉහත සඳහන් පාර්ශවයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ :*

''චයිනා නැෂනල් ටෙක්නිකල් ඉම්පෝර්ට් ඇන්ඩ් එක්ස්පෝර්ට් කෝපරේෂන් විසින් පත්වීමේ ලිපියක් නිකුත් කර ඇති හා එම ආයතනය විසින්ම සේවය අවසන් කර ඇති රිසෝසස් ඩිවලොප්මන්ට් කන්සල්ටන්ට්ස් ලිමිටඩ් විසින් වැඩ පැවරීම හා පාලනය සිදුකර ඇති ඒ. ඩී. සුමනසිරි මහතාගේ පත්වීම් ලිපියේ සඳහන් වැටුප වන රු. 30,000 ක මුදල හා ඊට අදාළ අතිකාල දීමනා නොගෙවීමෙන් ඔහුට අසාධාරණයක් සිදු වී ඇත් ද, එසේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.''

මෙම ආරාවුල සම්බන්ධයෙන් පළමු හා දෙවන පාර්ශවයන් විසින් සිය පළමු ප්‍රකාශ ඉදිරිපත් කර ඇති අතර දෙවන පාර්ශවයේ පළමු ප්‍රකාශය මගින් කරුණු දක්වමින් ප්‍රකාශ කර සිටිනුයේ මෙම ආරාවුල සම්බන්ධයෙන් මාතර කම්කරු විනිශ්චය සභාවේ නඩු අංක LT/M/26/31/2013 යටතේ නඩුවක් විභාග වූ බවත් එකී නඩුවේ තීන්දුව පරිදි පළමු පාර්ශවය වෙත රු. 112,000/- මුදලක් ගෙවීමට නියෝග කර ඇති බවත් ඒ හේතුවෙන් පළමු පාර්ශවයේ ඉල්ලීම නිෂ්ප්‍රභා කරන මෙන් ඉල්ලීමක් සිදුකර ඇත.

මෙම ආරාවුල විවෘත කාර්මික අධිකරණයේ කැඳවන ලද 2022.02.17 වැනි දින දෙවන පාර්ශවයේ දෙවන වගඋත්තරකරු වන රිසෝසස් ඩිවලොප්මන්ට් කන්සල්ටන්ට්ස් ලිමිටඩ් සමාගම ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් ඉල්ලා සිටින ලද්දේ එකී සමාගම පළමු පාර්ශවය සමග සේවා ගිවිසුමක් නොමැති බවත් මෙකී කාර්මික ආරාවුලට සමාගමේ සම්බන්ධතාවයක් හෝ අදාලත්වයක් හෝ නොමැති බැවින් රිසෝසස් ඩිවලොප්මන්ට් කන්සල්ටන්ට්ස් ලිමිටඩ් සමාගම මෙම ආරාවුලෙන් නිදහස් කරන ලෙසයි. එම ඉල්ලීම සම්බන්ධව පැමිණිලිකාර පළමු පාර්ශවය ප්‍රකාශ කර සිටිනුයේ මෙම නඩුවේ වගකීම් වලින් රිසෝසස් ඩිවලොප්මන්ට් කන්සල්ටන්ට්ස් ලිමිටඩ් සමාගම නිදහස් කිරීමට කිසිදු විරෝධතාවයක් නොමැති බවයි. ඒ අනුව රිසෝසස් ඩිවලොප්මන්ට් කන්සල්ටන්ට්ස් ලිමිටඩ් සමාගම මෙකී බේරුම්කරණ පරීක්ෂණයෙන් නිදහස් කිරීමට තීරණය කළෙමි.

මෙම ආරාවුල විවෘත අධිකරණයේ නැවත කැඳවන ලද අවස්ථාවේ දී දෙවන පාර්ශවයේ පළමු වගඋත්තරකාර ආයතනය වන චයිනා නැෂනල් ටෙක්නිකල් ඉම්පෝර්ට් ඇන්ඩ් එක්ස්පෝර්ට් කෝපරේෂන් සමාගම විසින් මෙම බේරුම්කරණය පවත්වාගෙන යාමට ගරු බේරුම්කරණයට අධිකරණ බලයක් නොමැති බවට පහත සඳහන් සිය මූලික විරෝධතා විවෘත අධිකරණයේ ඉදිරිපත් කර ඇත.

01. මෙම ඉල්ලුම්පත්‍රයට අදාලව කාර්මික ආරාවුල දැනටමත් මාතර කම්කරු විනිශ්චය සභාවේ LT/M/26/31/2013 නඩුව විනිශ්චය කර ඇත.

02. මාතර කම්කරු විනිශ්චය සභාව වෙත මෙම ඉල්ලුම්පත්‍රයේ ඉල්ලුම්කරු සහ වගඋත්තරකරු යන දෙදෙනාම ඉල්ලුම්කරුගේ මූලික වැටුප රු. 14,000/- බවට එකඟ වූ බවට 2016.04.20 දින නඩුවෙන් තහවුරු විය.

03. මෙම ඉල්ලුම්කරු සේවයෙන් පහකර වසර 9කට පසුව මාතර කම්කරු විනිශ්චය සභාවේ නියෝගය අනුව වසර 5කට පසුව පවා ගොනු කරන ලද ප්‍රමාද වූ ඉල්ලුම්පත්‍රයකි.

04. මෙම ඉල්ලුම්පත්‍රය මගින් ඉල්ලුම්කරුගේ යටි අභිප්‍රාය සහ වංක සිත පෙන්වයි.

05. මෙම තත්ත්වය තුළ ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය පවත්වාගෙන යාමට විරෝධතාවය දක්වන අතර සහ මෙම ඉල්ලුම්පත්‍රය පරීක්ෂණය ආරම්භ කරන මුල් අවස්ථාවේ දී ම ප්‍රතික්ෂේප කරන ලෙස ඉල්ලා සිටී.

පළමු පාර්ශවය විසින් දෙවන පාර්ශවයේ පළමු වගඋත්තරකරුගේ මූලික විරෝධතා ප්‍රතික්ෂේප කරමින් කරුණු ඉදිරිපත් කර ඇත්තේ මෙම ආරවුල බේරුම්කරණය කිරීමේ අධිකරණ බලය ගරු බේරුම්කරු වෙත ඇති බවයි. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් ලිඛිත දේශන ඉදිරිපත් කරන ලෙස දෙපාර්ශවයටම දැනුම්දීමෙන් පසු දෙපාර්ශවය විසින් ම සිය ලිඛිත දේශන මෙම බේරුම්කරණය වෙත ඉදිරිපත් කර ඇත. එකී මූලික විරෝධතා සම්බන්ධයෙන් ගරු කාර්මික අධිකරණය පහත පරිදි සිය ස්ථාවරය ප්‍රකාශ කර සිටියි.

**01. මෙම ඉල්ලුම්පත්‍රයට අදාලව කාර්මික ආරවුල දැනටමත් මාතර කම්කරු විනිශ්චය සභාවේ LT/M/26/31/2013 නඩුව විනිශ්චය කර ඇත.**

**02. මාතර කම්කරු විනිශ්චය සභාව වෙත මෙම ඉල්ලුම්පත්‍රයේ ඉල්ලුම්කරු සහ වගඋත්තරකරු යන දෙදෙනාම ඉල්ලුම්කරුගේ මූලික වැටුප රු. 14000/- බවට එකඟ වූ බවට 2016.04.20 දින නඩුවෙන් තහවුරු විය.**

දෙවන පාර්ශවයේ පළමුවන වගඋත්තරකරුගේ ඉහත දක්වා ඇති 01 සහ 02 විරෝධතා සම්බන්ධයෙන් විසඳිය යුතු ප්‍රශ්නය වනුයේ:

(අ) මාතර කම්කරු විනිශ්චය සභාව වෙත යොමු කරන ලද පැමිණිල්ලේ ප්‍රස්තුත විෂය කරුණ සහ කාර්මික අධිකරණයේ බේරුම්කරණ සඳහා යොමු කරන ලද පැමිණිල්ලේ ප්‍රස්තුත විෂය කරුණ එකම ප්‍රස්තුත විෂය කරුණක් සම්බන්ධයෙන් වන්නේ ද? එයට පිළිතුර ඔව් ලෙස ලැබේනම් 1950 අංක 43 කාර්මික ආරාවුල් (සංශෝධිත) පනතේ 31B (5) වගන්තිය ප්‍රකාරව බේරුම්කරණය සිදුකිරීමට අධිකරණ බලයක් නොමැති වන්නේ ද?

(ආ) ඉහත (අ) ප්‍රශ්නය සඳහා පිළිතුර 'නැත' යනුවෙන් ලැබේනම් පැමිණිලිකාර පාර්ශවයට හිමිවිය යුතු වැටුප සහ අනෙකුත් දීමනා කවරේ ද?

1950 අංක 43 කාර්මික ආරාවුල් (සංශෝධිත) පනතේ 31B (5) වගන්තිය මගින් මෙසේ දක්වා සිටියි.

"Where an application under subsection (1) is entertained by a labour tribunal and proceedings thereon are taken and concluded, the workman to whom the application relates shall not be entitled to any other legal remedy in respect of the matter to which that application relates, and where he has first resorted to any other legal remedy, he shall not thereafter be entitled to the remedy under subsection (1)."

ඒ අනුව පෙනීයන්නේ පනතේ 31B (1) උප වගන්තිය යටතේ වන ඉල්ලීමක් කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් පිළිගනු ලැබ ඒ පිළිබඳ නඩු කටයුතු කර අවසාන කර ඇති කල් හි ඒ ඉල්ලීමට අදාළ කරුණ සම්බන්ධයෙන් වෙනත් කිසිදු නෛතික සහනයක් ලබා ගැනීම සඳහා අයිතිවාසිකමක් ඒ ඉල්ලීමට අදාළ සේවකයාට නැත්තේය. තවද ඒ සේවකයා වෙනත් යම් නෛතික සහනයක් අරභයා කළින් කටයුතු කර තිබෙන අවස්ථාවක දී, (1) වන උප වගන්තිය යටතේ සහනයක් ලබා ගැනීමේ අයිතිවාසිකම ඉන්පසු ඔහුට නැතිව යන්නේ ය.

දෙවන පාර්ශවයේ පළමුවන වගඋත්තරකරුවන්ගේ ලිඛිත දේශනය සමඟ ඉදිරිපත් කර ඇති මාතර කම්කරු විනිශ්චය සභාවේ LT/M/26/31/2013 නඩුවේ සහතික පිටපත අධ්‍යයනය කිරීමේ දී පෙනී යන්නේ එකී නඩුවේ පැමිණිලිකරු වන රත්ගම, රිල්ලඹ, අංක 11 දරන ස්ථානයේ පදිංචි අල්බරදුර සුමනසිරි හෙවත් මෙම බේරුම්කරණයට ඉදිරිපත් කර ඇති ආරාවුලේ පැමිණිලිකාර පළමු පාර්ශවය වන ඒ. ඩී. සුමනසිරි මහතා විසින් 2013.04.18 දිනැතිව 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 31(ආ) වගන්තිය යටතේ කම්කරු විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ලේ 03. ඡේදය මගින් මෙසේ දක්වා ඇත.

''(03.) **මා සේවයෙන් පහ කරන විට මාසිකව රු. 30,000/- ක වැටුපක් ගෙවීමට එකඟව රුපියල් 14,000/- මුදලක වැටුපක් ගෙවා ඇත.**''

පැමිණිලිකාර පාර්ශවය විසින් මෙම බේරුම්කරණය සඳහා ඉදිරිපත් කර ඇති කාර්මික ආරාවුලට හේතු වී ඇති කරුණු ලෙස දක්වා ඇති කොටස යළි උපුටා දක්වමි.

''**චයිනා නැෂනල් ටෙක්නිකල් ඉම්පෝර්ට් ඇන්ඩ් එක්ස්පෝර්ට් කෝපරේෂන් විසින් පත්වීමේ ලිපියක් නිකුත් කර ඇති හා එම ආයතනය විසින්ම සේවය අවසන් කර ඇති රිසෝසස් ඩිවලොප්මන්ට් කන්සල්ටන්ට්ස් ලිමිටඩ් විසින් වැඩ පැවරීම හා පාලනය සිදුකර ඇති ඒ.ඩී. සුමනසිරි මහතාගේ පත්වීම් ලිපියේ සඳහන් වැටුප වන රු. 30,000/- ක මුදල හා ඊට අදාළ අතිකාල දීමනා නොගෙවීමෙන් ඔහුට අසාධාරණයක් සිදු වී ඇත් ද, එසේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.**''

ඒ අනුව බේරුම්කරණයෙන් විසඳිය යුතු වන්නේ ''**වැටුප වන රු. 30,000/- ක මුදල හා ඊට අදාළ අතිකාල දීමනා නොගෙවීමෙන් ඔහුට අසාධාරණයක් සිදු වී ඇත් ද?**'' යන්න වේ.

මේ අනුව පැහැදිලිව පෙනී යන්නේ මාතර කම්කරු විනිශ්චය සභාවේ LT/M/26/31/2013 නඩුවේ සාකච්ඡාවට බඳුන් වූ විෂයගත කරුණු සහ බේරුම්කරණය සඳහා ප්‍රස්තුත වී ඇති විෂය කරුණුවල සමානතාවයක් පවතින බවයි.

දෙවන පාර්ශවයේ පළමුවන වගඋත්තරකරුගේ ලිඛිත දේශන සමඟ ඉදිරිපත් කර ඇති මාතර කම්කරු විනිශ්චය සභාවේ LT/M/26/31/2013 නඩුවේ තීන්දුව ලබාදෙමින් කම්කරු විනිශ්චයාධිකාර කේ.සී. අතුකෝරාල මැතිනිය විසින් දක්වා ඇති පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරමි.

''**මෙම ඉල්ලුම්කරු ස්වකීය ඉල්ලුම්පත්‍රය මඟින් හිඟවැටුප් සහිතව නැවත රැකියාව ආයාචනය කල ද මෙම ඉල්ලුම්කරු විසින් වගඋත්තරකරු යටතේ සේවය සපයා ඇති ආකාරය සහ රැකියාවේ ස්වභාවය කෙරෙහි අවධානය යොමු කරමින් මෙම ඉල්ලුම්කරු නැවත සේවයේ පිහිටුවීම යෝග්‍ය නොවන බවට තීරණය කරමි.**

**ඒ අනුව මෙම ඉල්ලුම්කරුට අසාධාරණ සේවා සමාප්තිය හේතුවෙන් වන්දි මුදලක් ලබාදීම සාධාරණ සහ යුක්ති සහගත බවට තීරණය කරමි.**''

එකී තීන්දුවේ වැඩිදුරටත් දක්වා ඇත්තේ:

''**එලෙස වන්දි මුදල ගණනය කිරීමේ දී මෙම ඉල්ලුම්කරුගේ වයස, කෙටි කාලීන සේවා කාලය, ඉල්ලුම්කරු වගඋත්තරකරු යටතේ සේවය සපයා ඇති ආකාරය සහ රැකියාවේ ස්වභාවය මෙන් ම නඩුව සඳහා ගතවී ඇති කාලය යන කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් මෙම ඉල්ලුම්කරුට මාස 08 ක වැටුප වන්දි වශයෙන් ලබාදීම සාධාරණ සහ යුක්ති සහගත බවට තීරණය කරමි.**''

එකී නඩු තීන්දුව ප්‍රකාරව පැමිණිලිකාර පාර්ශවය හිමිකම් කියන මාසික වැටුප සම්බන්ධයෙන් මෙසේ දක්වා ඇත.

''**ඒ අනුව සලකා බැලිය යුතුව ඇත්තේ මෙම ඉල්ලුම්කරු කොපමණ මාසික වැටුපකට හිමිකම් කියන ලද්දේ ද යන්නයි. මෙම ඉල්ලුම්කරුගේ මූලික වැටුප රු. 14,000/- බවට** දෙපාර්ශවය විසින් පිළිගැනීම් ලෙස වාර්තා කර ඇත.

**ඒ අනුව මෙම ඉල්ලුම්කරුට හිමි එම මූලික වැටුප් පරිමාණය වන්දි මුදල ගණනය කිරීමේ පදනම ලෙස යොදා ගනිමි**''

මේ අනුව පැහැදිලිව පෙනී යන්නේ පැමිණිලිකරු විසින් ඉහත දැක්වූ LT/M/26/31/2013 නඩුවේ දී සිය මූලික වැටුප සම්බන්ධයෙන් ගත් ස්ථාවරය බේරුම්කරණයේ දී වෙනස් කර වෙනත් ස්ථාවරයක් ගෙන ඇති බවයි.

තවද ඉහත දැක්වූ LT/M/26/31/2013 නඩුව මගින් පැමිණිලිකාර පාර්ශවය වෙත රු. 112,000/- වන්දි මුදලක් ප්‍රදානය කර එකී නඩුව අවසන් කර ඇත.

දෙවන පාර්ශවයේ පළමු වන වගඋත්තරකරුගේ ලිඛිත දේශනය මගින් ඉදිරිපත් කර ඇති <u>*W. K. P. I. Rodrigo Vs Central Engineering Consultancy Bureau in SC/Appeal No. 228/2017 Decided on 02/10/2020*</u> ඇති නඩු තීන්දු කෙරෙහි අවධානය යොමු කරමි. එකී නඩු තීන්දුව මගින් විනිසුරු S. Thurairaja, PC, J. විසින් කාර්මික ආරාවුල් පනතේ 31B (5) වගන්තියේ අරමුණ පැහැදිලිව නිර්වචනය කර පෙන්වා දී ඇත.

"The effect of the first limb of section 31B (5) is clear as it explicitly precludes a workman from obtaining a determination by a Labour Tribunal of his application for relief or redress in respect of the termination of his services and, thereafter, proceeding to obtain another legal remedy in respect of the same subject matter from any other forum, whether that forum be a court of law, or a forum constituted under any of the provisions of the Act other than those in Part IV A of the Act, or any other forum which has the legal authority to determine such complaints.

Thus, in Devanayagam [at p. 305], Lord Guest and Lord Devlin appear to have had the first limb of section 31B (5) in mind when Their Lordships commented that

*"The workman has to make his choice between the remedy afforded by the Act and any other legal remedy he may have; he cannot seek both. If he goes to the Tribunal, the Tribunal's order settles the matter and is not to be called in question in any court except that there may be an appeal to the Supreme Court on an question of law."*

This view is reinforced by the statement [at p.313] made by Lord Guest and Lord Devlin in relation to section 31B (2) (b) of the Act, that a dismissal of an application to a Labour Tribunal under that provision

*"does not preclude the workman from pursuing his rights at common law since under s. 31B (5) they are excluded only where proceedings before the Tribunal are taken and concluded."*

It is apparent that the question of whether the first limb of section 31B (5) will apply and debar a workman from maintaining an action in a court [ or an application to another forum], by reason of the fact that the same workman has previously received a determination in respect of the same subject matter in an application made by him to a Labour Tribunal, is a question that will have to be decided by that court [ or other forum]. It is not a question that will come to the attention of a Labour Tribunal.I would also state here that, apart from section 31B (5) being designed to maintain and promote industrial peace, it is self- evident that the first limb of section 31B (5) is also founded on the principle of ***Res Judicata***," (Pages 12-13)

"Thus, if I am to reiterate the conclusion reached earlier, which, as seen from the preceding discussion, is endorsed by the reasoning applied in several previous decisions, the criteria upon which the second limb of section 31B (5) can be properly applied are that: (i) the action/application by the workman in the court or other forum must cover the same or

similar ground as the application to the Labour Tribunal and have the same or similar scope; (ii) the action/application by the workman in the court or other forum should seek the same or similar substantive reliefs as the application to the Labour Tribunal; (iii) both the action/application by the workman in the other forum and the workman's application to the Labour Tribunal should be decided upon the core issue of whether the termination of the workman's' services by the employer was done for good cause, according to the principles which are to be applied by the court or other forum; and (iv) there should not be a significant disparity between the procedure followed by the court or other forum and the procedure followed by a Labour Tribunal.

In my view, the second limb of section 31B (5) can be applied only if all these four criteria or, at least, a sufficient number of them are met, so as to satisfy the Labour Tribunal that there is no material disparity or divergence between the previous action/application made by the workman to a court of other forum and the subsequent application made by the same workman to the Labor Tribunal."
(Pages 21-22)

".................. As seen earlier, the first limb of section 31B (5) states that, where a workman has made an application to a Labour Tribunal " and proceedings thereon are taken and concluded, the workman to whom the application relates shall not be entitled to any other legal remedy in respect of the matter to which that application relates." [emphasis added by me]."
(Page 24)

විනිසුරු S. Thurairaja, PC, J. විසින් කාර්මික ආරවුල් පනතේ 31B (5) වගන්තියේ අරමුණ වඩා සවිස්තරව නිර්වචනය කරමින් "(1) **වන උප වගන්තිය යටතේ සහනයක් ලබා ගැනීමේ අයිතිවාසිකම ඉන්පසු ඔහුට නැතිව යන්නේය.**" යන්න තීරණය කිරීම සඳහා නිර්ණායකයන් 4 ක් හඳුන්වා දී ඇති අතර එකී නිර්ණායක සියල්ල හෝ ප්‍රමාණවත් පරිදි සපිරෙන්නේ නම් යම් සේවකයකුට 31B (5) වගන්තිය අනුව සහන ලබා ගැනීමේ අයිතිවාසිකම අහිමි වී යන්නේ ය.

විනිසුරු S. Thurairaja, PC, J. විසින් ඉහත නඩුව මගින් හඳුන්වා දී ඇති නිර්ණායකයන් අනුව සැලකීමේ දී පැමිණිලිකාර පාර්ශවය විසින් බේරුම්කරණය සඳහා කාර්මික අධිකරණයට යොමු කර ඇති මෙම නඩුව, (i) මාතර කම්කරු විනිශ්චය සභාවේ LT/M/26/31/2013 නඩුවේ සාකච්ඡාවට බඳුන් වී ඇති කරුණු හා සමාන විෂය පථයක් ඇත, (ii) කම්කරු විනිශ්චය සභාව වෙත යොමු කරන ලද පැමිණිල්ලෙන් අසාධාරණ සේවා සමාප්තිය පිළිබඳව සහන ඉල්ලා ඇති අතර එම නඩුවේ දී මූලික වැටුප රු.14,000/- බවට දෙපාර්ශවයම පිළිගෙන ඇත. බේරුම්කරණය සඳහා ඉදිරිපත් කර ඇත්තේ '...... **පත්වීම් ලිපියේ සඳහන් වැටුප වන රු.30,000/- ක මුදල හා ඊට අදාළ අතිකාල දීමනා නොගෙවීමෙන් ඔහුට අසාධාරණයක් සිදු වී ඇත් ද ?** යන්න පිළිබඳව තීරණය කිරීම සඳහා වන අතර එහි සඳහන් වැටුප පිළිබඳව මේ වන විටත් මාතර කම්කරු විනිශ්චය සභාවේ LT/M/26/3/2013 නඩුව මගින් සහන ලබා දී ඇත. (iii) මෙම ආරවුල සහ මාතර කම්කරු විනිශ්චය සභාවේ  දී ප්‍රශ්න ගත නඩුව යන දෙකෙහිම මූලය වන්නේ අසාධාරණ සේවා සමාප්තිය වන අතර ඒ හා අනුෂාංගික කරුණු මත මෙම ආරාවුල පැන නැගී ඇත. (iv) කම්කරු විනිශ්චය සභාව සහ බේරුම්කරණය යන ක්‍රියාවලීන් දෙකම සමාන ක්‍රියාපටිපාටීන් අනුගමනය කරයි.

ඉහත නිර්ණායක සහ දෙපාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණු අනුව සලකා බැලීමේ දී මෙකී ආරාවුල 1950 අංක 43 කාර්මික ආරාවුල් (සංශෝධිත) පනතේ 31B (5) වගන්තියට අනුගතවේ. ඒ අනුව දෙවන පාර්ශවයේ පළමු වන වගඋත්තරකරු විසින් ඉදිරිපත් කරන ලද පළමු සහ දෙවන මූලික විරෝධතාවයන් මා විසින් පිළිගනු ලැබේ.

03. **මෙම ඉල්ලුම්කරු සේවයෙන් පහකර වසර 9 කට පසුව මාතර කම්කරු විනිශ්චය සභාවේ නියෝගය අනුව වසර 5කට පසුව පවා ගොනු කරන ලද ප්‍රමාද වූ ඉල්ලුම්පත්‍රයකි.**

දෙවන පාර්ශවයේ පළමු වගඋත්තරකරු සිය වාචික සහ ලිඛිත දේශන මගින් කියා සිටින්නේ පළමු පාර්ශවයේ පැමිණිල්ල ඉදිරිපත් කර ඇත්තේ වසර 9 කට පසුව බවත් මාතර කම්කරු විනිශ්චය සභාවේ නියෝගය ලබා දී වසර 5 ක් ඉක්මවා ගොස් ඇති බවත් මාතර කම්කරු විනිශ්චය සභාවේ තීන්දුව සම්බන්ධයෙන් කිසිදු අභියාචනයක් සිදුකර නොමැති බවත්, ඒ අනුව පැමිණිලිකාර පාර්ශවය එකී නඩු තීන්දුවෙන් ප්‍රතිබන්ධනය වන බවත් ය.

පැමිණිලිකරු 2011.04.18 දින සිට 2012.10.19 වන දින දක්වා දෙවන පාර්ශවයේ පළමු වගඋත්තරකරු වන සේවායෝජක යටතේ සේවය කර ඇත. එකී සේවය අවසන් කිරීමෙන් පසු පැමිණිලිකරු විසින් මාතර කම්කරු විනිශ්චය සභාවේ LT/M/26/31/2013 නඩුව පවරා එකී නඩුවේ තීන්දුව 2016.04.20 වන දින ප්‍රකාශයට පත් කර ඇත. තවද, පැමිණිලිකරු සිය ලිඛිත දේශනය මගින් දක්වා ඇත්තේ පැමිණිලිකරු මාතර කම්කරු කොමසාරිස්ට පැමිණිලිකර ඇත්තේ 2012.06.14 වන දින බවත්, ඒ බව තහවුරු කිරීම සඳහා එකී පැමිණිල්ල A2 ලෙස සලකුණු කර ඇති බවත්, එකී පැමිණිල්ල මාර/කා.ස/2012/514 දරන ගොනුව යටතේ විභාග වූ බවත්, එකී පැමිණිල්ල වැඩිදුර විභාගය සඳහා කාර්මික අධිකරණය වෙත යොමු කර ඇති බවත් ඒ බව තහවුරු කිරීම සඳහා කාර්මික අධිකරණය විසින් පැමිණිලිකරු වෙත එවන ලද ලිපියේ මුල් පිටපත A3 ලෙස සලකුණු කර ඇති බවත් ය.

පැමිණිලිකරු විසින් සලකුණු කර ඇති A2 ලේඛනය හුදු ඡායස්ථ පිටපතක් පමණක් වන බවත් එය සත්‍ය පිටපතක් ලෙස සහතික කර නොමැති බවත් පෙනී යයි. එසේ වුවත් පැමිණිලිකරු විසින් සලකුණු කර ඇති A3 ලේඛනය මුල් ලේඛනයක් බැවින් එහි සඳහන් කරුණු අනුව මාර/කා.ස/2012/514 යටතේ පැමිණිල්ලක් මාතර කම්කරු කාර්යාලයට සිදුකර ඇති බව තහවුරුවේ.

එකී පැමිණිල්ල විභාග කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවට වර්ෂ 7 කට ආසන්න කාලයක් ගත වීම කිසිසේත් අනුමත කළ හැක්කක් නොවන බව මාගේ අදහසයි. පැමිණිල්ල විභාග කිරීම සඳහා ප්‍රමාද වීම පැමිණිල්කරුගේ පාර්ශවයෙන් සිදු වූවක් නොවන බව මාගේ අදහසයි.

1950 අංක 43 කාර්මික ආරාවුල් (සංශෝධිත) පනත යටතේ සහන ලබා ගැනීම සඳහා ඉල්ලුම්කරුවෙක් සාධාරණ හා යුක්ති සහගත කාලයක් තුළ පැමිණිල්ල සිදුකළ යුතු බව මාගේ අදහස වූවත් මෙම පැමිණිල්ල විභාග කිරීම ප්‍රමාද වී තිබීම සම්බන්ධයෙන් පැමිණිලිකාර පාර්ශවය වගකිව යුතු නොවේ. ඒ අනුව 03 වන මූලික විරෝධතාවය ප්‍රතික්ෂේප කරමි.

04. **මෙම ඉල්ලුම්පත්‍රය මගින් ඉල්ලුම්කරුගේ යටි අභිප්‍රාය සහ වංක සිත පෙන්වයි.**

මෙම ඉල්ලුම් පත්‍රය පැමිණිලිකරු මුල්වරට ඉදිරිපත් කර ඇත්තේ මාතර කම්කරු කොමසාරිස්ට 2012.06.14 වන දින සහ එකී පැමිණිල්ල මාර/කා.ස/2012/514 දරණ ගොනුව යටතේ විභාග වූවක් වෙයි. එකී පැමිණිල්ල වැඩිදුර විභාගය සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් කැඳවා ඇත්තේ 2019.08.28 දින හා IR/COM/01/2019/221 දාතම දරණ ලිපිය මගින් බවත් නිරීක්ෂණය වේ. ඒ අතර කාලය තුළ පැමිණිලිකරුගේ සේවය අවසන් කිරීම මත පැමිණිලිකරු විසින් මාතර කම්කරු විනිශ්චය සභාවේ LT/M/26/31/2013 නඩුවක් පවරා ඇති අතර එකී නඩුව 2016.04.20 දින පැමිණිලිකරුගේ වාසියට තීන්දුව ලබාදෙමින් අවසන් කර ඇත.

මාතර කම්කරු කාර්යාලයට සිදුකරන ලද පැමිණිල්ල වැඩිදුර විභාග කිරීම මත මෙම බේරුම්කරණය සඳහා ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

එබැවින් වගඋත්තරකාර පළමු පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති 04 වන මූලික විරෝධතාවය ප්‍රතික්ෂේප කරමි.

ප්‍රදානය

දෙපාර්ශවය විසින්ම ගොනු කරන ලද ලිඛිත දේශන සලකා බැලීමෙන් අනතුරුව පහත තීරණයට එළඹියෙමි. ඒ අනුව වගඋත්තරකාර පළමු පාර්ශවය වන චයිනා නැෂනල් ටෙක්නිකල් ඉම්පෝර්ට් ඇන්ඩ් එක්ස්පෝර්ට් කෝපරේෂන් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද මූලික විරෝධතා 04 න් පළමු සහ දෙවන මූලික විරෝධතාවයන් පිළිගනිමි. තුන්වන සහ සිව්වන මූලික විරෝධතාවයන් ප්‍රතික්ෂේප කරමි. එකී පළමු සහ දෙවන මූලික විරෝධතාව වන එනම්ඃ

01. මෙම ඉල්ලුම්පත්‍රයට අදාලව කාර්මික ආරාවුල දැනටමත් මාතර කම්කරු විනිශ්චය සභාවේ LT/M/26/31/2013 නඩුව විනිශ්චය කර ඇත,

සහ

02. මාතර කම්කරු විනිශ්චය සභාව වෙත මෙම ඉල්ලුම්පත්‍රයේ ඉල්ලුම්කරු සහ වගඋත්තරකරු යන දෙදෙනාම ඉල්ලුම්කරුගේ මූලික වැටුප රු. 14000/- බවට එකග වූ බවට 2016.04.20 දින නඩුවෙන් තහවුරු විය.

යන මූලික විරෝධතා පිළිගැනීම මත මෙම ආරාවුල පරීක්‍ෂාකර ප්‍රදනයක් ලබාදීමට අධිකරණ බලය මෙම කාර්මික බේරුම්කරණ විනිශ්චය සභාවට නොමැති බවට තීරණය කරන ලද අතර, මා වෙත යොමු කර ඇති ආරාවුල සම්බන්ධයෙන් තවදුරටත් පරීක්ෂණයක් පවත්වාගෙන යාමට මෙම බේරුම්කරණ අධිකරණයට බලයක් නොමැති බැවින් මෙම පරීක්ෂණ කටයුතු මෙයින් අවසන් කරමි.

ඒ අනුව පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් කිසිදු ප්‍රදනයක් නොකරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට තීරණය කරමි.

නීතිඥ පියල් දර්ශන ගුරුගේ
බේරුම්කරු.

2022 ජුනි මස 09 වැනි දින.

EOG 08-0141

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.